JMC vLearning
"your virtual learning partner"

# ආර්ථික විද්‍යාව - ECN 103

**Prepared by - Chinthaka Kelum Udayasiri**
**Visiting Lecturer (University of Colombo)**
**BBA (SP) Mgt (University of Colombo)**
**Gold Medalist (University of Colombo)**
**CIM (UK) Passed Finalist**
**AAT Passed Finalist**



# නිෂ්පාදන ක්‍රියාවලියේ හැසිරීම
# විවිධ වෙළඳපොළ ව්‍යුහයන්

## Unit – 03

JMC vLearning
"your virtual learning partner"

- නිෂ්පාදන පිරිවැය
  - හිමිකාරිත්වය අනුව
    - සෘජු පිරිවැය
    - වක්‍ර පිරිවැය
  - හැසිරීම අනුව
    - ස්ථාවර පිරිවැය
    - විචල්‍ය පිරිවැය

JMC vLearning
"your virtual learning partner"



# සෘජු පිරිවැය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආයතනය විසින් පිටතින් මිලදී ගත් යෙදවුම් සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයයි.

උදා - සේවකයන්ට ගෙවනු ලබන වැටුප්

විදුලි බිල් ගෙවීම

අමුද්‍රව්‍ය මිලට ගැනීම




IMC vLearning
“your virtual learning partner”



# චක්‍ර පිරිවැය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගනු ලබන ආයතනය සතු නිෂ්පාදන සම්පත් වල ආවස්ථික පිරිවැයයි

උදා - අහිමිවන පොළී ආදායම්

අහිමි වන බදු කුලී ආදායම

අහිමි වන වැටුප්

ප්‍රාමාණික ලාභ

ආර්ථික ක්ෂය වීම්

JMC vLearning
"your virtual learning partner"



# ආර්ථික පිරිවැය

- සෘජු හා වක්‍ර පිරිවැයන්ගේ එකතුවෙන් සමන්විත වේ.

# ගිණුම්කරණ පිරිවැය

- සෘජු පිරිවැය පමණක් ඇතුලත් කරයි.



JMC vLearning
"your virtual learning partner"

# ආර්ථික ලාභය

- මුළු අයභාරයෙන් සෘජු හා වක්‍ර පිරිවැයන්ගේ එකතුව අඩු කරනු ලබයි.

# ගිණුම්කරණ ලාභය

- මුළු අයභාරයෙන් සෘජු පිරිවැය පමණක් අඩු කරනු ලබයි.




JMC vLearning
"your virtual learning partner"

# උදාහරණ අභ්‍යාසය

ආයතනයක නිමැවුම ඒකක 500 කි. ඒකකයක මිල රු 400 ක් වේ. අමුද්‍රව්‍ය සඳහා රු. 25,000 ක් ද, වැටුප් සඳහා රු. 35,000 ක් ද ආයතනයට වැය වී ඇත.

අභිමි වූ වැටුප් ආදායම, අභිමි වූ පොළී ආදායම හා ආර්ථික ක්ෂය වීම පිළිවලින් රු 25,000ක් රු.10,000 ක් හා රු 15,000 ක් වේ.

- ➢ ආර්ථික ලාභය හා ගිණුම්කරණ ලාභය ගණනය කරන්න.



JMC vLearning
"your virtual learning partner"

# නිෂ්පාදන ශ්‍රිතය

$$Q = f\,(L, K)$$

යෙදවුම්

↓

ක්‍රියාවලිය

↓

නිමැවුම්





UMC vLearning
"your virtual learning partner"

# කෙටි කාලීන හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය

## කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය

- ................................................

## දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය

- ................................................

යෙදවුම්

↓

ක්‍රියාවලිය

↓

නිමැවුම්



JMC vLearning "your virtual learning partner"

# කෙටි කාලීන ඵලදා සංකල්ප



TP (මුළු නිෂ්පාදිතය)

AP (සාමාන්‍ය නිෂ්පාදිතය)

MP (ආන්තික නිෂ්පාදිතය)



JMC vLearning
your virtual learning partner

# හීනවන ඵලදා නීතිය




නිෂ්පාදන ආයතන විසින් කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යෑම

**හීනවන ආන්තික ඵලදා නීතිය නම් වේ.**



JMC VLearning
"your virtual learning partner"

# කෙටි කාලීන පිරිවැය සංකල්ප

- AFC (මුළු ස්ථාවර පිරිවැය)
- AVC (මුළු විචල්‍ය පිරිවැය)
- AC (සාමාන්‍ය මුළු පිරිවැය)
- MC (ආන්තික පිරිවැය)

JMC vLearning
"your virtual learning partner"

# දිගු කාලය

දිගු කාලයේදී සියලුම යෙදවුම් විචල්‍ය යෙදවුම් වන විට නිමැවුම හැසිරෙන ආකාරය පරිමාණානුකූල ඵල නීතිය ලෙස හැඳින්වේ. එහි ආකාර 03 කි

- වැඩි වන පරිමාණානුකූල ඵල
- අඩු වන පරිමාණානුකූල ඵල
- ස්ථාවර පරිමාණානුකූල ඵල

JMC vLearning "your virtual learning partner"

## වැඩි වන පරිමාණානුකූල ඵල හටගැනීමට හේතු . . .

- නිෂපාදන සාධක වල අභජ්‍යතාවය හෙවත් නොබෙදිය හැකි යෙදවුම් තිබිම
- ශ්‍රම විභජනය මගින් විශේෂ ප්‍රාගුණ්‍ය කිරීමේ හැකියාව
- යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේ හැකියාව
- එක් වරක දී පමණක් දැරිය යුතු වියදම් තිබීම




JMC vLearning
"your virtual learning partner"

## අඩු වන පරිමාණානුකූල ඵල හටගැනීමට හේතු . . .

- සම්පත් හීන වීම (සම්පත් ක්ෂය වීම)
- ආතතිය
- කළමණාකරණය හා සම්බන්ධීකරණය පිළිබඳ ගැටලු ඇති වීම



JMC vLearning
"your virtual learning partner"



JMC vLearning
“your virtual learning partner”

- ❑ පරිමාණානුකූල පිරිමැසුම්

යනු දිගු කාලයේ දී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරීමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය පහළ බැසීමයි. ඒ අනුව ආයතනයේ ධාරිතාව පුළුල් කිරීමත් සමගම නිෂ්පාදන සාධක වල කාර්යක්ෂමතාව ඉහළ යෑමත්, නිෂ්පාදන යෙදවුම් වල මිල පහළ වැටීමත් නිසා අත්පත් කර ගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණානුකූල පිරිමැසුම් හැඳින්විය හැකිය.

- ❑ පරිමාණානුකූල නොපිරිමැසුම්

යනු දිගු කාලයේ දී ආයතනයක් නිෂ්පාදන ප්‍රසාරණය කිරිමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය හෙවත් ඒකක පිරිවැය ඉහළ යාමයි. එනම් ආයතනයක ධාරිතාව පුළුල් කිරිමත් සමඟම නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව පහළ යෑම නිසා මූල්‍යමය වශයෙන් සිදු වන අලාභය වේ

JMC vLearning
"your virtual learning partner"

## අඩු වන  වන පරිමාණානුකූල ඵල

- පරිමාණානුකූල නොපිරිමැසුම් පවතින විට

## වැඩි වන පරිමාණානුකූල ඵල

- පරිමාණානුකූල පිරිමැසුම් පවතින විට

## ස්ථාවර පරිමාණානුකූල ඵල

- පරිමාණානුකූල නොපිරිමැසුම් හෝ පිරිමැසුම් නොපවතින විට

JMC vLearning
"your virtual learning partner"

# වෙළඳපොළ ව්‍යුහයන්

ඒකාධිකාරය

ඒකාධිකාරී තරඟය



JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරගයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) සමජාතීය භාණ්ඩ නිපදවීම.

(2) අබාධ පිවිසුම (free entry) හා පිටවීම.

(3) භාණ්ඩයේ මිල විකුණුම්කරු විසින් පමණක් තීරණය කරයි.

(4) වෙළෙඳපොළේ ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.

1.6 ආයතනයක් සඳහා මාසයක පිරිවැය තොරතුරු පහතින් ඔබට ලබා දී ඇත:

| | රු. |
|---|---|
| ඍජු පිරිවැය | 180,000 |
| වක්‍ර පිරිවැය | 45,000 |

ආයතනය මාසය තුළ ඒකක 2,500 ක් නිපදවා විකුණා ඇති අතර, විකුණුම් මිල ඒකකයක් රු.100/- බැගින් විය.

ඉහත තොරතුරු මත පදනම්ව, මාසය සඳහා ආර්ථික ලාභය වන්නේ:

(1) රු.70,000/-. (2) රු.25,000/-. (3) රු.205,000/-. (4) රු.225,000/-.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

*අංක **1.11** සහ **1.12** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.11** දී ඇති කාලපරිච්ඡේදය තුළ නිමැවුමෙහි ඒකකයක පිරිවැය, …………………… *(සාමාන්‍ය පිරිවැය / ආන්තික පිරිවැය)* ලෙස හඳුන්වනු ලැබේ.

**1.12** නිමැවුමේ සමානුපාතිකව වැඩිවීම, යෙදවුමේ සමානුපාතික වැඩිවීමට වඩා …………………… *(වැඩි / අඩු)* වූ විට, වැඩිවන පරිමාණානුකූල ඵල (returns to scale) ඇති වේ.

**1.17** හීනවන ආන්තික ඵලදා න්‍යාය (law of diminishing marginal returns) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** ඒකාධිකාරයේ ලක්ෂණ (characteristics) දෙකක්(02) සඳහන් කරන්න.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

## 05 වන ප්‍රශ්නය

(a) පූර්ණ තරඟකාරී ආයතන, කෙටිකාලයේදී ලාභ උපරිම කරගන්නේ කෙසේදැයි ප්‍රස්තාර කොළයක් භාවිත කර **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

*අංක **1.11** සහ **1.12** ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.11** ආයතනයක ආන්තික අයභාරය එහි .................. *(ආන්තික පිරිවැයට / සාමාන්‍ය පිරිවැයට)* සමාන වන අවස්ථාවේදී එහි ලාභය උපරිම වේ.

**1.14** ආර්ථික ක්ෂය, වක්‍ර පිරිවැය සඳහා උදාහරණයකි.

**1.18** වැඩිවන පරිමාණානුකූල ඵල (increasing returns to scale) ඇති වීම කෙරෙහි බලපාන සාධක දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** ආන්තික ආදායම [Marginal Revenue (MR)], යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

(b) නිෂ්පාදන ක්‍රියාවලියක කෙටි කාලය (short run) සහ දිගු කාලය (long run) අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**.

(ලකුණු 04)

(c) ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළක (monopolistic competitive market) ලක්ෂණ දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

**1.13** වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල පිරිසක් සිටින වෙළෙඳපොළ ව්‍යුහයක් කතිපයාධිකාරී (oligopoly) වෙළෙඳපොළක් වේ.

**1.14** “ආර්ථික ක්ෂයවීම”, වක්‍ර පිරිවැය සඳහා උදාහරණයකි.

**1.18** පරිමාණානුකූල ඵලයන්හි (Returns to Scale) අදියරයන් (stages) දෙකක්(02) සඳහන් කරන්න.

**1.19** ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.20** කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

JMC vLearning “your virtual learning partner”

# පසුගිය විභාග ප්‍රශ්න

## 04 වන ප්‍රශ්නය

(a) පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ලක්ෂණ හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, ඍජු පිරිවැයක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ආර්ථික ක්ෂයවීම. (2) සාමාන්‍ය ලාභ.

(3) ද්‍රව්‍ය පිරිවැය. (4) කැපකළ පොලී ආදායම.

**1.11** ඒකකාධිකාරී තරඟකාරී (monopolistic competitive) ආයතන .................. *(දිගු කාලයේදී / කෙටි කාලයේදී)* ප්‍රාමාණික ලාභ පමණක් උපයනු ලබයි.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

*අංක 1.13 සිට 1.15 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී ස්ථාවර සාධක යෙදවුම් කිසිවක් නොමැත.

1.14 හීනවන ආන්තික ඵලදා න්‍යායට අනුව, විචල්‍ය සාධක යෙදවුම් සමජාතීය වන අතර නිෂ්පාදන ක්‍රියාවලිය පුරාම තාක්ෂණය ඒකාකාරීව පවතින බවට උපකල්පනය කෙරේ.

1.19 නිෂ්පාදන ක්‍රියාවලියේදී දිගුකාලීන නිෂ්පාදනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

JMCvLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

**1.4** කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාලව නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) ස්ථාවර සාධක යෙදවුම් නොමැත.

(2) ස්ථාවර සාධක යෙදවුම් සහ විචල්‍ය සාධක යෙදවුම් යන දෙවර්ගයම භාවිත කෙරේ.

(3) සියලුම සාධක යෙදවුම්, ස්ථාවර සාධක යෙදවුම් බවට පත්වේ.

(4) විචල්‍ය සාධක යෙදවුම් වෙනස් නොවේ.

**1.12** ……………… *(සාමාන්‍ය නිෂ්පාදනය / ආන්තික නිෂ්පාදනය)* ශුන්‍ය වන විට, මුළු නිෂ්පාදනය උපරිම වේ.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

1.6 යෙදවුම් වැඩි කිරීමට සමානුපාතිකව අඩු ප්‍රමාණයකින් මුළු නිමැවුම වැඩි වන්නේ නම්, ආයතනය අත්විඳිනු ලබන්නේ:

(1) වැඩිවන පරිමාණුකූල ඵලයි.
(2) අඩුවන පරිමාණුකූල ඵලයි.
(3) හීනවන ආන්තික ඵලයි.
(4) ස්ථාවර පරිමාණුකූල ඵලයි.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාධිකාරී තරගයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) අබාධ පිවිසුම සහ පිටවීම.
(2) නිෂ්පාදන සාධකවල පූර්ණ සංචලතාවය.
(3) සමජාතීය භාණ්ඩ තිබීම.
(4) දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ලැබීම.

1.19 මුළු නිෂ්පාදිතය [Total Product (TP)] සහ සාමාන්‍ය නිෂ්පාදිතය [Average Product (AP)] අතර වෙනස සඳහන් කරන්න.

JMC vlearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, වැඩිවන පරිමාණානුකූල ඵල හට ගැනීමට බලපාන සාධකයක් **නොවන්නේ** කුමක් ද?

(1) කළමනාකරණයේ ගැටළු.

(2) නිෂ්පාදන සාධකවල නොබෙදිය හැකි බව.

(3) ඉහළ තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර භාවිතය.

(4) එක් වරකදී පමණක් දැරිය යුතු වියදම් තිබීම.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක නිරත ආයතනයක් සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) ඕනෑම ආයතනයකට ආර්ථික ලාභ ලබමින් වෙළෙඳපොළ තුළ රැඳී සිටිය හැකිවීම.

(2) එයට දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ ලැබිය හැකිය.

(3) වෙළෙඳපොළින් පිටවීමට බාධා පැවතීම.

(4) එය සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කරයි.

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

**1.12** ……………… *(ඒකාධිකාරී තරඟකාරී / ඒකාධිකාරී)* ආයතනයක් විසින් දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ පමණක් ලබයි.

(b) පහත සඳහන් තොරතුරු භාවිතයෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය [Average Variable Cost (AVC)] **ගණනය කරන්න**:

| **ප්‍රමාණය** | **මුළු විචල්‍ය පිරිවැය (TVC)** | **සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC)** |
|---|---|---|
| 1 | 150 | |
| 2 | 250 | |
| 3 | 330 | |

(ලකුණු 03)

(c) ආන්තික පිරිවැය [Marginal Cost (MC)] සහ ආන්තික ආදායම [Marginal Revenue (MR)] අතර වෙනස **පැහැදිලි කරන්න**.

(ලකුණු 03)

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක නිරත ආයතනයක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ (normal profit) ලබයි.

(2) එය වෙළෙඳපොළ මිල තීරණය කරනු ලබයි.

(3) සමීප ආදේශක නොමැතිවීම.

(4) ආයතනය සතු නිෂ්පාදන සාධක කර්මාන්තයේ නියුතු වෙනත් ආයතනයක් වෙත පහසුවෙන් රැගෙනයාමට නොහැකි වීම.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.13** නිමැවුමේ සමානුපාතික වැඩිවීම, යෙදවුමේ සමානුපාතික වැඩිවීමට වඩා අඩු වූ විට, වැඩිවන පරිමාණානුකූල ඵල (returns to scale) ඇතිවේ.

**1.14** ආන්තික පිරිවැය යනු අතිරේක ඒකකයක් නිපදවීමේ ප්‍රතිඵලයක් ලෙස මුළු පිරිවැයට එකතු වන අතිරේක පිරිවැය වේ.

JMC vLearning
"your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

1.10 කළමනාකරුවෙකු විසින් ඔහුගේ ව්‍යාපාරයට අදාලව, පහත සඳහන් පිරිවැය හඳුනාගෙන ඇත:

| | රු. ('000) |
|---|---:|
| ගෙවූ වේතන | 1,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 2,500 |
| ආර්ථීක ක්ෂය වීම | 500 |
| කැපකල පොලී ආදායම | 300 |

මූළ සෘජු පිරිවැය සහ මූළ වක්‍ර පිරිවැය පිළිවෙලින්, වනුයේ *(රු.'000)*:

(1) 2,500 සහ 500. (2) 3,500 සහ 800. (3) 1,300 සහ 2,500. (4) 3,500 සහ 1,500.

JMC vLearning "your virtual learning partner"

# Thank You

JMC vLearning
"your virtual learning partner"